# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 2 දරන ශ්‍රී ලංකා
# වරායවල් පිළිබඳ අධිකාරිය
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1992 පෙබරවාරි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

## 1992 අංක 2 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 පෙබරවාරි මස 19 වන දින]

එල්. ඩී.—ඕ. 28/89

**1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1992 අංක 2 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (1984 අංක 7 දරන පනතින් සහ 1984 අංක 35 දරන පනතින් සංශෝධිත) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතේ 39 (1) වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

1979 අංක 51 දරන පනතේ 39 (1) වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය හැකිය." යන වචන වෙනුවට "ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ ටෙන්ඩර් කැඳවීමෙන් හෝ විකුණනු ලැබිය හැකිය, නැතහොත් බැහැර කරනු ලැබිය හැකිය." යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ආ) ඡේදයේ ඇති "බඩු කිසිවක් විකිණීමක් හෝ බැහැර කිරීමක් සඳහා ද ඒ විකිණීම හෝ බැහැර කිරීම පිණිස ඒ බඩු තක්සේරුව සඳහා ද ප්‍රධාන රේගු අයකැමිගේ එකඟත්වය ඒ විකිණීම හෝ බැහැර කිරීම සඳහා ලබා ගන්නා තෙක් ද බඩු විකිණීමේ හෝ බැහැර කිරීමේ දිනය ප්‍රධාන රේගු අයකැමි වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලබන තෙක් ද ඒ බඩු විකිණීම හෝ බැහැර කිරීම මේ වගන්තියේ විධිවිධාන යටතේ නොකළ යුතුය." යන වචන වෙනුවට "බඩු කිසිවක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන හෝ බැහැර කරනු ලබන දිනය හෝ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමේ දිනය ප්‍රධාන රේගු අයකැමිට දන්වනු ලබනතුරු සහ එකී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම හෝ බැහැර කිරීම පිළිබඳව හෝ ටෙන්ඩර් කැඳවීම සඳහා වූ දැන්වීම පිළිබඳව සහ ඒ බඩු එසේ විකිණීම හෝ බැහැර කිරීම සඳහා එම බඩු තක්සේරු කිරීම පිළිබඳව ඔහුගේ එකඟත්වය ලබාගන්නා තුරු මේ පනතේ විධිවිධාන යටතේ එම බඩු විකිණීම හෝ බැහැර කිරීම හෝ කරනු නොලැබිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එහි (ඇ) ඡේදයේ ඇති " ඒ විකිණීමේ දී යම් ලන්සුවක් නොතබනු ලැබිණී නම්, " යන වචන වෙනුවට " ඒ වෙන්දේසිය මගින් විකිණීමේ දී හෝ බැහැර කිරීමේ දී කිසිම ලන්සුවක් නොතබනු ලැබිණී නම් හෝ එම ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමට පිළිතුරු වශයෙන් කිසිම ටෙන්ඩරයක් නොලැබිණී නම් " යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. විදේශීය රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.